# S. Thomas' College – Gurutalawa Divinity

**Gread 06** **SINHALA MEDIUM**

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
  **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

**(01)** ජේසුස් වහන්සේ ස්වර්ගස්ථ වූයේ,

1. ගලිලයේ දී ය. 2. නාසරෙත්හි දී ය.
3. බෙතානියාවේ දී ය. 4. ජෙරුසලමේ දී ය.

**(02)** හිංසාවට පත්වූ මිනිසා කවුද

1. සේවකයා 2. අන්ධයා
3. ජුදේවු ජාතිකයෙක් 4. ලෙවී ජාතිකයෙක්

**(03)** මව්පියන්ට සංග්‍රහ කිරීමට අපට නියම වන්නේ

**(i)** දෙවන දේව පනතනි **(ii)** සිව්වන දේව පනතනි
**(iii)** තෙවන දේව පනතනි **(iv)** පස්වන දේව පනතනි

**(04)** ආබ්‍රහම්තුමාගේ ගම වන්නේ

**(i)** ඌර් **(ii)** මිදියන් **(iii)** ඒදොම් **(iv)** කුෂ්

**(05)** දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වූයේ

**(i)** දේදුන්න ය **(ii)** චර්ම ඡේදනය ය **(iii)** වර්ෂාව ය **(iv)** ගින්දර ය

**(06)** බයිබලයේ තිබෙන පොත් ගණන කීය ද?

1. පොත් 66 2. පොත් 27

3. පොත් 39 4. පොත් 76

**(07)** ජේසුතුමාගේ දෙමාපියන්

**(i)** එලිසබෙත් හා සෙකරියස් **(ii)** ලූක් හා මාක්

**(iii)** මීකා හා සාමුවෙල් **(iv)** ජෝසෙප් හා මරියතුමිය

**(08)** මැවිල්ලේ උසස්ම නිර්මාණය වන්නේ

**(i)** මිනිසා ය **(ii)** මත්සයයින් ය **(iii)** කුරුල්ලෝ ය **(iv)** අහස ය

**(09)** ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් ගණන

**(i)** 02 යි **(ii)** 05 යි **(iii)** 07 යි **(iv)** 15 යි

**(10)** ජේසුස් වහන්සේ බෞතීස්ම කලේ

**(i)** ජොහාන් තුමා **(ii)** මීකා **(iii)** දාවිත් රජ **(iv)** සාමුවෙල්

(11). ජේසුස් වහන්සේ ජෙරුසලමට ගියේ මොන සතා පිටද

**(i)** බැටළුවා **(ii)** කොටළුවා **(iii)** ගවයා **(iv)** අශ්වයා

(12). ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්තාන වී ප්‍රථමයෙන් දර්ශණය වූයේ

**(i)** ස්ත්‍රීන්ට **(ii)** දේවදූතයාට **(iii)** තෝමස්ට **(iv)** දාවි

(13). දේව රාජ්‍ය පවතින්නේ කොහේද?
**(i)** අහසට උසින් **(ii)** පොළව පුරා **(iii)** අප අතරය **(iv)** ගෝලයන් සමග

(14). දේව රාජ්‍යයේ ප්‍රධානතම ගුණාංගය වන්නේ
**(i)** සාමයයි **(ii)** ප්‍රේමයයි **(iii)** සාධාරණත්වයයි **(iv)** ගෞරව කරයි

(15). මාගේ ස්වාමීනි මාගේ දෙවියනි යනුවෙන් ප්‍රකාශ කලේ කවුද?
**(i)** තෝමස් **(ii)** රූත් **(iii)** සෙකරියස් **(iv)** ජොවන්නා

(16). ජේසුස් වහනසේට ගෝලයින් ගණන

**(i)** 12 කි **(ii)** 13 කි **(iii)** 20 කි **(iv)** 10 කි

(17). මාරුත දමනයේදී මුහුද සමාන කලේ කුමකටද?

**(i)** විශ්වාසයට **(ii)** නපුරට **(iii)** විනාශයට **(iv)** ඇඳකිල්ලට

(18). උන් වහන්සේ භාවනා කිරීමට තෝරා නොගත් ස්ථානයකි

**(i)** කඳු මුදුන් **(ii)** මුහුදු වෙරළ **(iii)** මිටියාවත් **(iv)** වැව් තාවුල්ල

(19). ශාස්ත්‍රවන්තයන් ජේසු බිළින්දාට නමස්කාර කිරීමට ගෙන ගිය දෙයක් වන්නේ

**(i)** තුවරලා **(ii)** රෙදි **(iii)** තෑගි **(iv)** සාක්ෂි

(20). ජේසුස් වහන්සේ ජෝසෙප් තුමා සමඟ ජෙරුසලම් දේව මාලිගාවට ගියේ වයස අවුරුදු කීයේද?

**(i)** වයස 14 දී **(ii)** වයස 10 දී **(iii)** වයස 15 දී **(iv)** වයස 12 දී

- **ප්‍රශ්න 06 කට පිලිතුරු සපයන්න**

**II** කොටස

(1).

(i) පරිසරය විනාශ වන ආකාර 05ක් සඳහන් කරන්න.
(ii) ශුද්ධ වු බයිබලයේ සඳහන් පරිදි බිලිඳු ජේසු බැහැ දැකීමට පැමිණි අය නම් කරන්න.
(iii) නත්තල සැමරීම හා සම්බන්ධව කිතුනුවන් යොමුවන යහපත් පිළිවෙත් 03ක් පෙන්වා දෙන්න.
(iv) දොලොස් හැවිරිදි ජේසු තුමා දේව සබඳතාවය වර්ධනය කරගත් සේ ඔබටද දේව සබඳතාවය වර්ධනය කරගත හැකි ආකාර 03ක් ලියන්න.
(v) ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය තුලින් අපට ලැබී ඇති විශේෂ වරප්‍රසාදය ලියන්න.

(2)

අ. දෙවියන් වහන්සේගේ හඬ අපට ඇසෙන මාර්ග තුනක් ලියන්න.

ආ. බයිබලයේ දස පනතෙන් පස්වන පස්වන පනත ලියන්න.

ඇ. දෙවියන් වහන්සේගෙන් සමාව ලබා ගැනීම සඳහා අප කළ යුතු දේවල් මොනවාද ?

(3) පහත සඳහන් වාක්‍ය යා කරන්න

(i) ජෝර්දාන් නදියේදී ජොහාන් තුමාගේ සේවය විය

| | | |
|---|---|---|
| (ii) | ක්‍රිස්තු බෞතිස්මයේ දි පරෙවියා | ජේසුස් වහන්සේය |
| (iii) | ජනතා හදවත් පවිත්‍ර කිරීම | බැතිමතුන් සවිය ලබත් |
| (iv) | දෙවිදුන්ගේ ප්‍රියාදර පුත්‍රයා | ජලයේ ගිල්වා බෞතිස්මය සිදු විය |
| (v) | ශුද්ධාත්ම බළයෙන් | ශුද්ධාත්මය සංකේතවත් විය |

(4)

(i) අපට ආලෝකය දීමට දෙවියන් වහන්සේ මවා ඇති ආකාශ වස්තු මොනවාද?

(ii) ආකාශ වස්තු ඉටු කරන කර්යන් මොනවාද?

(iii) බීජ උපදවන ඇට සහිත ගස් නිර්මාණය කලේ කිනම් දිනයේදිද?

(iv) මැවිල්ල පසු සැම දිනකම දෙවියන් වහන්සේ තම මැවිල්ල ගැන දුටුවේ මොනවාද?

05.

**(i)** පවුලක් හා සමාජයක් වශයෙන් අප එකට ජිවත්විමේදි ලැබෙන විශේෂකම් 05ක් ලියන්න

**(ii)** අද සමාජයේ දරුවන්ට ඇති පිඩාවන් ලියන්න

**(iii)** ජේසුස් වහන්සේ කුරුසියේ දි පැවසු වදන් තුලින් ඔබ ඉගෙනගත් කරුණු 03ක් ලියන්න

06.

**(i)** දේව ගරුබිය යනු කුමක්ද?
මිනිසා විසින් දේව මැවිල්ල විනාශ කරන අවස්ථා දෙකක් ලියන්න

**(ii)** උන් වහන්සේ ඉගැන්වීම සඳහා තෝරා ගනු ලැබු ස්ථාන දෙකක් ලියන්න

**(iii)** දෙවි පියාණන් වහන්සේ මිනිසාට මිනිසාට ලබාදුන් වගකීම් ලියන්න

07.

**(i)** ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් දෙක ලියන්න

**(ii)** ශුද්ධ බයිබලයේ පංච පුස්තකය ලියන්න

**(iii)** ඔබ දන්නා බයිබල් පාඩයක් ලියන්න